# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1792/19 - 2013 ජනවාරි මස 09 වැනි බදාදා - 2013.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2006 අංක 11 දරන මුදල් පනත**

2(1) (ආ) (i) සහ (ii) වගන්තිය යටතේ නියමය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු 2006 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයේ (i) වැනි සහ (ii) වැනි උපඡේද මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම මේ නියමය මගින් පහත දැක්වෙන පරිදි තීරණය කරමි.

(1) ඉහත කී පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයේ (ii) වැනි උප ඡේදයේ කාර්යය සඳහා "අවසරලත් මෝටර් වාහනය" සංයුක්ත වන මෝටර් වාහන වර්ගය විය යුත්තේ මෝටර් කාරයක්, සහ

(2) අය කරනු ලබන මෝටර් වාහන අනුග්‍රාහක බද්ද වනුයේ, (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව, එම තැනැත්තා විසින් ගෙවිය යුතු බදු වල මුළු එකතුවෙන් සියයට හැත්තෑපහක අනුප්‍රමාණයකට ගණන් බලනු ලබන මුදලකි.

මෙම නියමයෙන් "මෝටර් වාහන අනුග්‍රාහක බද්ද" යන්නෙන් 2006 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයේ (i) වැනි හෝ (ii) වැනි උප ඡේද ප්‍රකාර පනවනු ලැබූ බද්ද අදහස් වේ.

2006 අංක 11 දරන මුදල් පනතේ 2 වැනි වගන්තියේ (1) උප වගන්තියේ (ආ) ඡේදය යටතේ සාදනු ලැබ 2011 ජුනි මස 07 වැනි දිනැති අංක 1709/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

01 - 690